# 24
# v වැනි කාශ්‍යප රජුගේ ( ක්‍රි.ව. 914-923 ) පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය

*පුෂ්ප කුමාර, ජී. ජී. එස්. සී.*[1]

ලෝකයේ කිසියම් රටක හෝ සංස්කෘතියක ඓතිහාසිකමය තොරතුරු අනාවරණය කර ගැනීමෙහි ලා ප්‍රාමාණික වන ප්‍රධානතම මූලාශ්‍රයයක් ලෙස ශිලා ලේඛන නම් කළ හැකි වේ. එසේ නම් කළ හැකි ශිලා ලිපියක් ලෙස v වැනි කාශ්‍යප රජුගේ පුවරු ලිපිය හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනයෙන් v වැනි කාශ්‍යප රජුගේ පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය පිළිබඳ විමර්ශනය කෙරේ. මූලික වශයෙන් භික්ෂූන් වහන්සේ, රාජ්‍ය නිලධාරීන් සහ විහාරස්ථානවල සේවක නිලධාරීන් අනුගමනය කළ යුතු නීති රීති පද්ධතියක් මෙහි ඇතුළත් වී ඇත. මෙම අධ්‍යයනයේ දී අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනය හා සම්බන්ධ ව පැවති ප්‍රධාන ආයතනයක් වන අධිකරණය, කෙසේ ක්‍රියාත්මක වූයේ ද, එහි ක්‍රියාකාරීත්වය කෙබඳු වී ද යන්න අධ්‍යයනය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ශිලා ලේඛන සංග්‍රහයන් ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන වෙනත් කෘති ද යොදා ගැනෙයි. ඒ අනුව මෙම පුවරු ලිපියෙන් හෙළි වන අධිකරණ ක්‍රමය පිළිබඳ කරුණු සාකච්ඡා කෙරෙන අතර නිශ්චිත වශයෙන් නිගමනය කිරීමට සාධක ඇති කරුණු නිශ්චිත නිගමනයන් සහිත ව ද විවාදපන්න කරුණු නිශ්චිත නිගමනයකට එළඹීමකින් තොරව ද දක්වෙයි. විවිධ මතවාද සහිත කරුණු සන්සන්දනාත්මක ව විමසා වඩාත් ම පිළිගත හැකි මතය ඉදිරිපත් කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පදඃ v වැනි කාශ්‍යප රජු, අධිකරණ ක්‍රමය, ශිලා ලේඛන, අනුරාධපුර, මූලාශ්‍රය

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, sahanchathuranga102@gmail.com*